European Union

# ඒකාබද්ධ නිවේදනය

යුරෝපා සංගමයේ නියෝජිත මණ්ඩලය (EU) ප්‍රංශ, ජර්මන්, ඉතාලි, නෙදර්ලන්ත, රුමේනියා තානාපති කාර්යාල ද, එක්සත් රාජධානි මහ කොමසාරිස් කාර්යාලය, ස්විට්සර්ලන්ත සහ නෝර්වේ තානාපති කාර්යාලවල එකඟතාව මත පහත නිවේදනය නිකුත් කරයි.

සාමය සහ සංහිඳියාව අනතුරේ හෙලමින් ශ්‍රී ලංකාවේ මුස්ලිම් ප්‍රජාව ඉලක්කර ගනිමින් ක්‍රියාත්මකවන දේශපාලනික සහ ආගමික බලපෑම් පිළිබඳ අපගේ දැඩි අවධානය යොමුවී ඇත. මාධ්‍ය මගින් නොකඩවා ප්‍රචාරය කරනු ලබන අගතිගාමී සහ සත්‍යතාව තහවුරු කර නොගත් තොරතුරු මගින් සිදුවන්නේ මෙම නොසන්සුන්කාරී තත්ත්වය වර්ධනය වීම පමණි.

අද දින ගරු අග්‍රාමාත්‍යතුමා සමග පැවති රැස්වීමකදී අපි අපගේ අදහස් එතුමාට දැන්වීමු. එහිදී අපි වෛරී ප්‍රකාශවලට එරෙහි වීමට සහ ආගමික සංහිඳියා මණ්ඩලයක් ස්ථාපනය කිරීමට රජය දක්වා ඇති කැපවීම අපි පිළිගත්තෙමු.

සියලු ප්‍රජාවන් අතර සාමකාමී යහ පැවැත්ම ආරක්ෂා කිරීම සඳහා කටයුතු කරන සියලු ශ්‍රී ලාංකිකයන්ට අප සහයෝගය ලබාදෙන අතර ආගමික සහ අනෙකුත් ප්‍රජා නායකයන් ද ඔවුන්ට සහයෝගය ලබා දීමටත් ප්‍රචණ්ඩත්වයට එරෙහිව ද හඬ නගනු ඇති බවත් අපි අපේක්ෂා කරමු.

අන්‍යොන්‍ය ගරුත්වය, සාධාරණත්වය ඇති කිරීමට සහ විශ්වාසය හෝ ජනවර්ගය යන සාධකවලින් තොරව සියලු දෙනාට සමානව නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා රජයේ කැපවීම තවදුරටත් තහවුරු කරන ලෙස අපි ජනාධිපතිතුමාගෙනුත්, අගමැතිතුමාගෙනුත් සියලු දේශපාලන නායකයන්ගෙනුත් තරයේ ඉල්ලා සිටිමු.

*2019 ජුනි 12,* කොළඹදීය

-අවසන්-

සම්බන්ධීකරණය:
දේශපාලන, වෙළඳ සහ සන්නිවේදන අංශය
යුරෝපා සංගමයේ ශ්‍රී ලංකා සහ මාලදිවයින් නියෝජිත මණ්ඩලය
දු.ක: *+ 94 11 2674413-4*